# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/12 - 2010 පෙබරවාරි 09 වැනි අඟහරුවාදා - 2010.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/51/2007.

**කාර්මික ආරවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2009 ජුනි මස 05 දින අංක 1604/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009 මැයි මස 28 දින දරන නියෝගයෙන් එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06 හි ලංකා වතු සේවා සංගමය සහ අනෙක් පාර්ශවය වශයෙන් දෙහිවල, කළුබෝවිල, තැ. පෙ. 1052, දුටුගැමුණු වීදිය, අංක 1/101 හි සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2009 නොවැම්බර් මස 11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2010 ජනවාරි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

එක් පාර්ශවයක් වශයෙන්,
ලංකා වතුසේවක සංගමය,
අංක 06, ඇලෝයි මාවත,
කොළඹ 03.


IA - G 12417— 350 (2010/02)


නඩු අංකය : ඒ 3289

හා

අනෙක් පාර්ශවය වශයෙන්,
සීමාසහිත කළුබෝවිටියාන තේ
කර්මාන්ත ශාලා සමාගම,
අංක 1/101, දුටුගැමුණු වීදිය,
තැ. පෙ. 1052,
කළුබෝවිල,
දෙහිවල

*අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි.*

*ප්‍රදානය*

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39, (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියැවෙන ) පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පණත් වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2009 මැයි මස 28 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශවය අතර පැවැති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

01. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම විසින් 2003 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම සමාගමේ වැඩ බලන ලේකම් තනතුරකට පත් කරනු ලැබූ පද්මිණී පෙරේරා මහත්මියට ඒ සඳහා වැඩබැලීමේ දීමනාව වශයෙන් එදින සිට ගෙවනු ලැබූ අදාළ වැටුපෙන් 25%ක ගෙවීම 2007 ජනවාරි මස

01 දින සිට අත්හිටුවීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් එකී සමාගම වෙතින් ඇයට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න හා,

(ඈ) සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් 2002 මාර්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පද්මිණී පෙරේරා මහත්මිය එකී වැඩ බලන ලේකම් තනතුරෙහි රාජකාරී කටයුතුවල යොදවනු ලැබීම සැලකිල්ලට ගෙන එදින සිට ලේකම් තනතුරෙහි ස්ථිරත්වය ලබා ගැනීම සඳහා ඇය හිමිකම් ලබන්නේ ද යන්න හා එලෙස හිමිකම් නොලබන්නේ නම්,ඇයට සමාගම වෙතින් හිමි විය යුතු වෙනත් සහනයන් මොනවා ද යන්න හා,

02. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් 2001 නොවැම්බර් මස 01 දි සිට ක්‍රියාත්මක වන පරිදි එම සමාගමේ වැඩ බලන ලේකම් තනතුරකට පත් කරනු ලැබූ තලගලගේ සමන්මලී මහත්මියට ඒ සඳහා වැඩබැලීමේ දීමනාව වශයෙන් එදින සිට ගෙවනු ලැබූ අදාළ වැටුපෙන් 25% ක ගෙවීම 2007 ජනවාරි මස 01 දින සිට අත්හිටුවීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් එකී සමාගම වෙතින් ඇයට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න හා,

(ඈ) සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම විසින් 2001 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි වැඩ බලන ලේකම් තනතුරකට පත් කරනු ලැබූ තලගලගේ සමන්මලී මහත්මියට 2002 මැයි මස 01 දින සිට ලේකම් තනතුරට පත් නොකිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් සිදු වූයේ නම්, ඇයට සමාගම වෙතින් කුමන සහනයක් ලැබිය යුතු ද යන්න පිළිබඳව ද වේ.

***පෙනී සිටීම.***

පළමු පාර්ශවය වන තලගලගේ සමන්මලී - ලඝු යතුරු ලේඛක (සිංහල ) සහ කේ. ආර්. පී. පී. පෙරේරා (දුරකථන ක්‍රියාකාරිණී) යන අය වෙනුවෙන් ලංකා වතුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් බන්දුල ගමගේ මහතා පෙනී සිටි අතර,

දෙවන පාර්ශවය වෙනුවෙන් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කළමණාකරු (පරිපාලන හා මානව සම්පත්) ටී. ඩබ්. එම්. එස්. පී. බණ්ඩාර මහතා පෙනී සිටින ලදී.

පාර්ශවයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම නඩුව 2009.10.06 දින කැඳවූ අවස්ථාවේ අධිකරණය ඉදිරිපත් කළ යෝජනා පරිදි දෙපාර්ශවයටම සමථයක් සම්බන්ධයෙන් සලකා බැලීමට කල් ලබා දෙන ලදී. එනම්, ඊලඟ දින 2009 නොවැම්බර් මස 11 දින මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන බව ද දැනුම් දී ඇත.

2009 නොවැම්බර් 11 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දෙපාර්ශවයම සමථයකට එළඹෙන බව පැවසූ හෙයින් මම සමථ නියෝගය ප්‍රකාශ කරමි. එම සමථ නියෝගය මෙසේය.

උසාවිය ඉදිරියේ ඉදිරිපත් කරන ලද යෝජනා පරිදි දෙවැනි පාර්ශවකරු, පළමු වැනි පාර්ශවකරුවන් වන කේ. ආර්. පී. පී. පෙරේරා මිය සහ සමන්මලි තලගලගේ මහත්මිය යන දෙදෙනාටම 2009 නොවැම්බර් මස 03 වැනි දින දාතමින් ලබාදී ඇති පත්වීම් ලිපි මෙසේය.

**සමන්මලී තලගලගේ මියට පෞද්ගලික සහකාර තනතුර දී** ඇය කළමනාකාර අධ්‍යක්ෂගේ පෞද්ගලික සහකාර තනතුරට පත් කිරීමට 2009 ඔක්තෝබර් මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බව සතුටින් දන්වමි.

" ඔබගේ පත්වීමේ දිනය 2007 ජනවාරි මස 01 වැනි දින පෙරදාතම කරනු ලැබේ.

එසේ වුව ද 2010 ජනවාරි මස 01 වැනි දින සිට වසර දෙකක් ඇතුළත ඔබ විසින් අ.පො. ස. (සා. පෙළ) ගණිතය විෂය සඳහා සම්මාන සාමාර්ථය ලබාගත යුතුය. 2010 ජනවාරි මස 01 වැනි දින සිට වසර 02 ක කාලයක් තුළ ඔබ විසින් අ.පො. ස. (සා. පෙළ) ගණිත විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ගැනීමට අපොහොසත් වුවහොත් ඔබ ලඝු / යතුරු ලේඛිකා (සිංහල ) තනතුරට නැවත පත් කරනු ඇත.

ඔබ කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව කළමනාකරණ සහකාර සේවයේ MA 1 - 1 රු. 13,320 - 10 x 120 - 7 x 140/ - 4 x 210 - 20 x 290 - 22,140 යන වැටුප් පරිමාණයේ රු. 15,360.00 වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

මෙම තනතුර ලබාදීම හේතුවෙන් ඔබගේ වැටුප් වර්ධක දිනයේ කිසිදු වෙනසක් සිදු නොවන අතර, ඔබට නිකුත් කර ඇති 1998 ඔක්තෝබර් මස 12 දිනැති පත්වීම් ලිපියෙහි සඳහන් කොන්දේසිවල ද කිසිදු වෙනසක් සිදු නොවේ."

"එසේම **කේ. ආර්. පී. පී. පෙරේරා මියට - රහස්‍ය ලේකම් තනතුර** ලබා දී ඇය සභාපතිතුමාගේ රහස්‍ය ලේකම් තනතුරට පත් කිරීමට 2009 ඔක්තෝබර් මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බව සතුටින් දන්වමි.

ඔබගේ පත්වීමේ දිනය 2007 ජනවාරි මස 01 දිනට පෙරදාතම් කරනු ලැබේ.

එසේ වුව ද 2010 ජනවාරි මස 01 වැනි දින සිට වසර 02ක් ඇතුළත ඔබ විසින් අ.පො.ස (සා. පෙළ) ගණිතය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබාගත යුතු ය. 2010 ජනවාරි මස 01 වැනි දින සිට වසර 02ක කාලයක් තුළ ඔබ විසින් අ.පො.ස. (සා. පෙළ) ගණිතය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා ගැනීමට අපොහොසත් වුවහොත් ඔබ දුරකථන ක්‍රියාකරු තනතුරට නැවතත් පත් කරනු ඇත.

ඔබ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව කළමණාකරණ සහකාර සේවයේ MA 1 - 1 රු. 13,320 - 10 x 120- 7 x 140 - 4 x 210 - 20 x 290 - 22,140 යන වැටුප් පරිමාණයේ රු. 15,360.00 වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

මෙම තනතුර ලබාදීම හේතුවෙන් ඔබගේ වැටුප් වර්ධක දිනයේ කිසිදු වෙනසක් සිදුනොවන අතර, ඔබට නිකුත් කර ඇති 2000.11.09 දිනැති පත්වීම් ලිපියෙහි සඳහන් කොන්දේසිවල ද කිසිදු වෙනසක් සිදු නොවේ. ''

පාර්ශවකරුවන් දෙදෙනාම පත්වීම් ලිපි ද පිළිගෙන භාරගත් නිසා මේ කොන්දේසි වලට යටත්ව සමත නියෝගය ප්‍රකාශ කරමි.

එසේම අද දින උසාවියේ දී ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපිය අනුව පළමුවැනි පාර්ශවකරුවන් වන සමන්මලී තලගලගේ මිය සහ පද්මිණී පෙරේරා මියට දෙවැනි පාර්ශවය විසින් ඒ තනතුරට අදාළ රාජකාරි ලැයිස්තුවක් නිකුත් කළ යුතුය.

එසේම අසාධාරණ විදියට කටයුතු නොකරන බවටත්, මෙහිදී සඳහන් කළ යුතු ය.

මේ තනතුරු වලට අදාළ වැටුප් සහ හිග වැටුප් මේ මස ඇතුළත (2009 නොවැම්බර් මස ඇතුළත ) ගෙවීමට දෙවැනි පාර්ශවකරුවන් එකග වූහ.

පාර්ශවකරුවන් දෙදෙනාම 2009 නොවැම්බර් මස 03 දිනැති ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව කටයුතු කර තිබේ නම්, එදින සිට ඉහත ලිපියේ සඳහන් තනතුරුවල ස්ථිර කරන ලද ලිපිය ලබා දිය යුතු ය.

මේ ඉහත කරුණු වලට අදාළව පළමුවැනි පාර්ශවකරුවන් හා දෙවැනි පාර්ශවකරුවන් කියවා තේරුම් අරගෙන මෙම නඩු වාර්තාවේ අත්සන් කර, ඒවා ක්‍රියාත්මක කිරීමට එකග වේ.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බව මාගේ නිගමනය වේ.

ටී. එඩ්මන් සාන්තරාජන්,
බේරුම්කරු,

2009 නොවැම්බර් මස 11 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

02 - 544